# මුලු රටටම කිරි

රටක ජනතාවට ප්‍රමාණවත් කිරි සහ කිරි පදනම් කරගත් ආහාර ලැබේනම් එය එම ජනතාව සුඛිත මුදිත කරලීමට අවශ්‍ය එක් වැදගත් අංශයක් සපුරාලුවා වනු ඇත. මේවා රටේම නිපදවා ගත් පමණට රට ඒ අංශයෙන් පෝෂිත වනු ඇත.

හැකි මට්ටමින් පශු සම්පත් පවත්වා ගැන්මත්, එමගින් කිරි සහ කිරි ආහාර නිපදවා ගැන්මත් අප රටේ සෑම පෙදෙසකම වාගේ ගම් බද ජනයා නියැලී සිටියහ. ජනගහනය වැඩිවීම සහ ව්‍යාප්තවීමත් නාගරීකරණය සහ වාණිජකරණයන් සමග මේ අංශවල පිරිහීම පටන්ගැනිණ. අද තත්වයන් අනුව එම ආකාරයෙන් කිරි ආහාර නිශ්පාදනය කිසිසේත් ප්‍රමාණවත් නොවන අතර පිටරට වලින් කිරිපිටි සහ කිරි පදනම් කරගත් බටර් චීස් වැනි නිෂ්පාදන විශාල ප්‍රමාණයක් ආනයනය කරනු ලබයි.



පසුගිය දශක දෙක තුළ අප රටේ පශු ආශ්‍රිත නිෂ්පාදන පරිභෝජනය වැඩිවෙමින් පවතින බව පැහැදිලිව ඇත. එය ජනතා සෞඛ්‍ය අංශයෙන් හොඳ ලකෂණයකි. අපේ මිනිස්සු කිරිවල අගය දනිති. එය පෙර කල සිටම පැවතුණි. අද ජනතාව රසකළ කිරි යෝගට් අයිස්ක්‍රීම් ආදිය ආශාවෙන් කති බොති.

දැනට දශක දෙක තුනකට පෙර ළමුන් මන්ද පෝෂණයෙන් වලක්වාලීම පිණිස පාසැල්වල නිද හස් දිවා භෝජනය සමග ඇමරිකාවෙන් ප්‍රධානය කරන ලද පිටිවලින් කිරි එකක් දෙන ලද බව අපට මතකය. මෙයින් සහ කිරි ආහාර ගැනීමට ජනතාව නැඹුරු වීමත් සමග මන්ද පෝෂණය බොහෝ දුරට වැළැක්වී ගියේය.

අද අප රටේ කිරි පිළිබඳ හරි වැඩපිළිවෙලක් නොමැති බැවින් ඕස්ට්‍රේලියාවෙන් හා නවසීලන්තයෙන් කිරිපිටි විශාල ප්‍රමාණයක් ආනයනය කෙරේ. ඒ කිරිපිටි ග්‍රෑම් 400 ක පැකට්ටුවක් රුපියල් 300 ක් පමණ වෙයි. එය දුප්පතාට නොව මධ්‍යම පන්තිකයාට පවා ඔරොත්තු නොදෙන මිළකි.

අද අපරට කිරි පිටි පමණක් මෙට්‍රික් ටොන් 70000 ක් පමණ වසරකට ආනයනය කරයි. ඒ ටොන් එකක් ඩොලර් 3000ක් පමණ වෙයි මේ අනුව කිරිපිටි සඳහා පමණක් ශ්‍රීලංකාව රුපියල් බිලියන 21 ක් පමණ වැය කරයි. බටර් චීස් වැනි අනෙක් කෂීර ආහාරසඳහා යන වියදමද එකතු වුණ විට වියදම රුපියල් බිලියන 40 ක් ඉක්මවන්නේය. ඉදින් අප රටේම පශු සම්පත් දියුණු කරන්නේ නම්

## රටේ පශු සම්පත් වර්ධනය කරලීම

නව රජයේ වැඩපිළිවෙල යටතේ හැම අංශයකින්ම සංවර්ධනයට ප්‍රධානම තැනදී ඇත. පසුගිය දෙසැම්බර් පැවති රැස්වීමකදී ජනාධිපතිතුමා කිරි සහ කිරි ආශ්‍රිත දෑ සඳහා වැයවන විශාල විනිමය සම්භාරය ගැන සඳහන් කරමින් ශ්‍රීලංකාව පශු සම්පතින් ස්වයං පෝෂණය කරගතහොත් එම මුදල් සම්භාරය වෙනත් සංවර්ධන කටයුතු සඳහා යෙදිය හැකි බව අවධාරණය කළේය.

## පශු සම්පත් වර්ධනයට රටේ ඇති පදනම

පැරණි ඉන්දියාවේ මෙන්ම පැරණි ශ්‍රීලංකාවේද ගම්බදව පශු සම්පත් අගය කිරීම සහ සිය කිරි ආහාර සපයා ගැනීමද සිදුවිය. පස්ගෝරස යනුවෙන් හැඳින්වෙන කිරි මෝරු මුදවාපු කිරි වෙඩරු ආදිය සකස් කර ගැන්ම සිදුවිය. ගම්බද බොහෝ ගෙවල් වල හරක් දෙතුන් දෙනෙකු ඇති කරනු ලබයි. ගෙදර කීප දෙනෙක් ඒ හරක් ඉඩ පාඩු ඇති වතු වල බඳිති. නැතිනම් ගමේ හෝ වෙළේ ඇවිද තණ කොළ කපාගෙන අවුත් හරකුන්ට කවති. උන්ගේ පිරිමි සතුන් කරත්ත වල බැඳීමට හෝ ගොවිතැන් කටයුතු වල යෙදවිණ. ගැහැණු සතුන් පැටව් ලද විට කිරි ගැනීමට යොදවා ගනිති. මෙයට අමතරව ගොවිතැන සඳහා මී හරක් යොදවන ප්‍රදේශවල එම කිරිවලින් මුදවාපු කිරි නිෂ්පාදනය කොට වෙළඳපොළට සපයනු ලබයි. හම්බන්තොට කන්තලේ සහ අම්පාර මෙයට හොඳ උදාහරණය.

උතුරේ සහ නැගෙණහිර ද්‍රවිඩ ජනතාව අතරද, වතුකරයේ උඩරට ප්‍රදේශවලද පශු සම්පත් වර්ධනය කර ඇත. උඩරට සිංහළ පෙදෙස් වල හරක් ඇතිකිරීම සහ කිරි සැපයීම වාණිජ මට්ටමෙන් කෙරේ. අඹේවෙල පශු ගොවිපළ මෙයට හොඳම උදාහරණයයි.

ලංකා කිරි ආහාර **Lanka Milk Foods** මෙවැනි කිරි හා ඒ ආශ්‍රිත ආහාර වානිජ මට්ටමින් නිෂ්පාදනය කරන නවීන සමාගම්ද පිහිටුවා ඇත. දැන් කාලයක සිට අපේ රටේ ජනප්‍රිය කිරිපිටි වර්ග වන ලක්ස්ප්‍රේ, ඩැනෝ වැනි නිෂ්පාදන වඩා විශාල මට්ටමකින් කර්මාන්ත ශාලාවල නිසපාදනය කරති. මේවා ඩෙන්මාර්කය නවසීලන්ත වැනි රටවල නවීන නිෂ්පාදන මට්ටම් වලටම මේ සමාගමේ කර්මාන්ත ශාලාවල අපේ කිරි භාවිතා කරමින් අන්තර් ජාතික සම්මත මට්ටමට නිෂ්පාදනය කරනු ලබයි. එසේම එදිනෙදා භාවිතයට අළුත් ද්‍රවකිරි එකතුකර වෙළඳපලට ඉක්මනින් ලබාදීමද දැනන් මොවුන් ආරම්භ කොට ඇත. උඩරට ප්‍රදේශ වල එවැනි කිරි එකතුකරන මධ්‍යස්ථාන පිහිටුවා ශීත කරනයන් සවිකළ නවීන කිරි එකතුකරන ට්‍රක් රථ යොදා ගනිමින් නගරයේ වෙළඳ මධ්‍යස්ථාන වලට කිරි සැපයීම දැන් දියුණු වෙමින් පවතී. අඹේවෙල හරක් ගොවිපළේ කිරිද මෙසේම මහනුවර වැනි නගර වලට දැන් සැපයේ. මෙවැනි නවීන ක්‍රම යොදාගෙන අළුත් කිරි සැපයීම අපට කළ හැකි බව මෙයින් ඔප්පු වී ඇත. චොකලට්, වැනිලා, ස්ට්‍රෝබෙරි, බනානා රසැති මෙවැනි දියර කිරි නගර වල ජනයා අතර ජනප්‍රිය පානයක්වී ඇත.

## ඉන්දියාවේ කිරි නිශ්පාදනය සහ අපට ගත හැකි පාඩම්

සංස්කෘතික වශයෙන් කිරි හරකා පූජනීය වස්තුවක් ලෙස සලකන ඉන්දියාවේ කිරි නිෂ්පාදනයට කවදත් ඉහළ තැනක් ලැබිණ. දශක ගණනක ක්‍රමානුකූල සංවර්ධනයක ප්‍රතිඵලයක් ලෙස අද ඉන්දියාව කිරෙන් ස්වයං පෝෂිත රටක් වශයෙන් සැලකිය හැකිය. අප රට මෙන් නොව ඉන්දියාව පිටරට වලින් කිරි පිටි බටර් චීස් ආදිය කිසිවක් ආනයනය නොකරයි. මෙයම එහි සාර්ථකත්වය විදහා පායි.

## ජාතික පශු සම්පත් මණ්ඩලය National Dairy Development Board

මෙය 1965 දී ඉන්දියානු පාර්ලිමේන්තුවෙන් සම්මත කළ පණතක් මගින් ස්ථාපිත කෙරුණකි. **Amul** නමින් එකල හැඳින්වුණු ඉතා සාර්ථකව ක්‍රියාත්මක වුණ කයිරා කිරි නිෂ්පාදකයින්ගේ සමූපාකාර සංගමයේ සාර්ථකත්වය නිදසුනට ගනිමින් එය රටටම ව්‍යාප්ත කිරීම සඳහා මෙම මණ්ඩලය පිහිටුවන ලදී. විවිධ කිරි නිෂ්පාදක සමූපාකාර සමිති තුළ කටයුතු කළ කිරි ගොවීන්ගේ සම්ප්‍රදායික දැනුම හා දැක්ම වෘත්තීමය නවීන කළමනාකරණය හා සම්බන්ධ කොට විශාල නගරවල පවා අමුකිරි (fresh milk) වෙළඳපොළ අල්ලා ගනිමින් මේ මණ්ඩලය පුළුල් ලෙස වර්ධනය විය.

එහි ආරම්භක සභාපති වූ ආචාර්ය වර්ගීස් කුරියන්ගේ දුරදැක්ම මත එය ඉතා හොඳින් වැඩිණ. මෙහි සාර්ථකත්වය මගින් රටටම කිරි ආනයනය කිරීම සම්පූර්ණයෙන්ම නවතාලීම ඔහුගේ දැක්ම විය. කිසිම කිරි නිෂ්පාදන බහු ජාතික සමාගමකට ඉඩ නොලැබෙන සේ ජනතාවගේ කිරි හා පශු සම්පත් අවශ්‍යතා එයින් සම්පූර්ණයෙන් සපුරාලනු ලබයි. විවිධ අවස්ථාවල ඉන්දියාවට ගිය මේ ලියුම්කරු සැමවිටම දුටුවේ ඕනෑම තැනකදී අළුත් කිරි සහ කිරි ආහාර ලාභයට මෙන්ම නොඅඩුව ලබාගත හැකි බවයි. විශේෂයෙන්ම ලෝක බැංකුව සමග 1970 සිට 1996 දක්වා Operation Flood කිරි උතුරා යැවීමට සැලැස්වූ ව්‍යාපෘතිය මගින් ඉන්දියාව ලෝකයේ විශාලතම කිරි නිෂ්පාදකයා බවට පත්කර ලීම සාර්ථකව සම්පූර්ණ කරන ලදී. එහි ප්‍රධාන අරමුණු තුනක් විය. ඒවා නම් කිරි නිෂ්පාදනය වැඩිකරලීම, කිරි නිෂ්පාදනයේ නියැළුණු ගොවීන්ගේ ආදායම් ඉහළ දැමීම සහ පාරිභෝගිකයාට සාධාරණ මිළට කිරි සහ පශු ආහාර ලබාදීම මේ සඳහා සමස්ථ ඉන්දියාවේම පශු සම්පත් සමූපාකාර සමාගම් 9600 ක් Ananda Pattern ආනන්ද රටාව නමින් හැඳින්වෙන නවීනතම පරිගණක මගින් පාලනය වන ජාලයක් මගින් ගම් මට්ටමේ සමිතියේ සිට ප්‍රාදේශීය රාජ්‍යය දකිවා මේවා සහ සම්බන්ධතාවෙන් කටයුතු කෙරේ. නවීනතම නිෂ්පාදන ක්‍රම, පශු සම්පත් සංවර්ධන ක්‍රම, කිරි එකතුකිරීමේ හා බෙදාහැරීමේ කළමනාකරණයන් මේ සෑම තැනම යෙදේ. වෙන සියල්ල පැත්තකට දැම්මද බිලියනයක ජනතාවක් කිරි සම්පත්වලින් ස්වයං පෝෂිත කිරීමම ආශ්චර්යයක් නොවේද?

## මේවායින් අපට ගතහැකි පාඩම්

දශක තුනක සිට අප රටේ පශු සම්පත් අමාත්‍යංශයක් තිබිණ. අදද තිබේ. එදා පශු සම්පත් ඇතිවූයේ දැන් සිටින තොන්ඩමන් මහතාගේ සීයා වූ ජෝෂ්ඨ තොන්ඩමන් මහතාය. දිගටම ඔහු යටතේ පැවති එම අමාත්‍යංශයෙන් රටට සිදුවූ සේවයක් නැත. දැන් සිටින තොන්ඩමන් යටතේද කෙරෙන දෙයක් පෙනෙන්නට නැත. මොහු යටතේ මෙය තිබුණ හොත් ඔහුගේ මුනුබුරා පැමිණෙන තුරුත් අප රටට ඒ අංශයෙන් සෙතක් නෙවෙනු ඇත. අප ඒ වන විටද බිලියන ගණන් ගෙවා කිරිපිටි ආනයනය කරනවා ඇත. දකුණු පළාතේ ප්‍රාදේශීය සභාව මගින් මාතර දිස්ත්‍රික්කයේ පශු කාර්මික ගම්මාන පිහිටුවා කටයුතු කිරීමේ වැඩපිළිවෙලක් යෝජනා කෙරුනද එය හමස් පෙට්ටියට වැටුණු බවක් පෙනීයයි.

## කළයුතු දේවල්

ප්‍රථමයෙන් කළ යුත්තේ ඉන්දියාවේ කළාක් මෙන් පශු සම්පත් මන්ඩලයක් පිහිටුවීමයි. ඉන්දියාව ප්‍රාන්ත රාජ්‍ය මගින් සංවිධානය කළ ආකාරයට අප රටේ ප්‍රාදේශීය සභා යටතේ සංවිධානය කළ හැකිය. ජනාධිපතිතුමාගේ යෝජිත ග්‍රාමීය සභා යටතේ පශු සංවර්ධනයේ යෙදෙන ගොවීන්ගේ සමූපාකාර සමිති ආදිය පිහිටුවා දැනට යෙදී සිටින ගොවීන්ට ආධාරකිරීමද අළුත් සමිති පිහිටුවා ඔවුන් දිරි ගැනිවීමද කළ හැකිය. මෙම අදහස් ජනතාව අතරට යවා පුබුදුවා ලිය යුතුය. සංවර්ධන කළ යුත්තේ එවැනි පුබුදුවාලීම් මගිනි. ඒවා සිර්ථක වී අපේ රට කිරියෙන් ඉතිරවීම අපට කළ හැකිය. කළ යුතුය.

♦ **වකුල ගුණපාල**
**Ilford Essex UK**

# මැයි 20 විජයග්‍රහණ සැමරුම්!





අති විශිෂ්ඨ ජයග්‍රහණයක් සනිටුහන් කරමින් ශ්‍රීලංකා වීරෝදාර සන්නද්ධ හමුදා දශක තුනකට වැඩි කාලයක් ශ්‍රීලංකා භූමිය විනාශ කළ රුදුරු තුච්ඡ කොටි ත්‍රස්තවාදය මුලිනුපුටා දැමූ ඒ ආශ්චර්යමත් දිනය එනම් 2009 මැයි මස 20 අපට, අප දේශයට ඉතා වැදගත් දිනයක් වෙයි. සැබැවින්ම අප රට සැනසුම් සුසුමක් හෙලූයේ එදාය. කඳුලැල් පිසදා ලක්මාතාව සිනා බිඳක් නැගූයේ එදාය. ඒ සියල්ලට අපි නමස්කාර පූර්වකව සන්නද්ධ හමුදා, පොලීසිය හා සිවිල් ආරකෂක බලකායේ රණ විරුවන්ට සදාණයගැති බව සඳහන් කරමු. ඔව්හු ජීවිත පරිත්‍යාගයෙන් යුතුව නොපසුබටව ක්‍රියාකරමින් රටත් ජනතාවත් ආරකෂාකිරීම ගැන ඔවුන්ට ස්තුති කරන්නට වචන අප ළඟ නැත. ඔව්හු වැටී පැගී තිබුණු අභිමානය යළි නගා ලූහ. මේ සියල්ලට දිරිය නොඅඩුව සැපයූ වර්තමාන ජනාධිපතිතුමා ද අරකෂක ලේකම් තුමාද ඇතුළු සියළු දේශප්‍රේමීන්ට අපේ ස්තුතිය නොමඳව පුද කරන්නේ රුදුරු ත්‍රස්තවාදය පරාජය කරන්නට ඒ හැමගේ දායකත්වය ඉමහත් පිටිවහලක් වූ නිසාය.

මේ ලද නිදහස යළිත් ගිලිහී යා නොදී රැකගනිමු. නැවත ත්‍රස්තවාදයකට ඉඩ නොදෙන්නට සුපරීක්ෂාකාරීව හිඳිමු. සතුරන් හා මිතුරන් කවුරුදැයි හඳුනාගනිමු. මේදින විජයග්‍රහණය සමරමින් දිවිපිදූ ඒ රණවිරුවන් සිහිකරන්නට නිවසේ පහනක් දල්වන මෙන් අපි ඔබගෙන් ඉල්ලා සිටිමු.